ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ அதிவிசேஷமானது EXTRAORDINARY

අංක 1167/3 – 2001 ජනවාරි 15 වැනි සඳුදා – 2001.01.15
1167/3 ஆம் இலக்கம் – 2001 ஆம் ஆண்டு சனவரி மாதம் 15 ஆம் திகதி வியாழக்கிழமை
No. 1167/3 – MONDAY, JANUARY 15, 2001

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.) (அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது) (Published by Authority)

# I වැනි කොටස : (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. – බී. 4/96 II.

### 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත

1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 28 සහ 29 වන වගන්ති සමග කියවිය යුතු 61 වන වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝග.

මහින්ද රාජපක්ෂ,
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

2001 ජනවාරි මස 11 වන දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2001 (මඩකලපුව කලපු) ධීවර කළමනාකරණ ප්‍රදේශ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. බලපත්‍ර දරන්නෙකු වෙත නිකුත් කරන ලද බලපත්‍රයක "මඩකලපුව කලපු ධීවර කළමනාකරණ ප්‍රදේශය සඳහා වලංගු වේ" යන නිර්දේශය සඳහන් වන්නේ නම් මිස, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති මඩකලපුව කලපු ධීවර කළමනාකරණ ප්‍රදේශය ඇතුළත කිසිම බලපත්‍ර දරන්නෙකු විසින් ධීවර මෙහෙයුම් කටයුතු වල නොයෙදිය යුතුය.

3. මේ නියෝගවල කාර්යය සඳහා (මේ නියෝග වල "ප්‍රදේශය" යනුවෙන් සඳහන් කරනු ලබන) මඩකලපුව කලපු ධීවර කළමනාකරණ ප්‍රදේශය, මෙම උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි කොටස් තුනකට බෙදා වෙන්කරනු ලැබේ.

4. ප්‍රදේශය තුළ කරෙයිවලෙයි හෝ අදින දැල් (මාදැල්) වලින් ධීවර මෙහෙයුම් කටයුතු කිරීම තහනම් කරනු ලබන අතර එකී ප්‍රදේශයේ ඕනෑම කොටසක විසිදැල් හෝ විචුවලෙයි හා යොත් පන්නය භාවිත කරනු ලැබිය හැකිය.

5. කිසිම බලපත්‍ර දරන්නෙකු විසින් මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති –

(අ) දෙවන කොටසෙහි, සෙන්ටි මීටර 7.62 (අඟල් 03)කට අඩු පාවෙන දැලක් හෝ අඩසිවලෙයි භාවිත නොකළ යුතුය ;

(ආ) 1 සහ 3 වන කොටස්වල, විසිදැල් හෝ විවුවලෙයි සහ යොත් පන්නය හැර, වෙනත් දැල් භාවිත නොකළ යුතුය.

6. කිසිම බලපත්‍ර දරන්නෙකු විසින් –

(අ) කලපුවේ මසුන් ඇල්ලීමේ කාර්යය සඳහා හරිකේන් ලන්තෑරුමක් හෝ චූලු ලාම්පුවක් හැර වෙනත් කිසිම තාප දීප්ත පහන් හෝ කෘත්‍රිම එළි භාවිත නොකළ යුතුය ;

(ආ) කිසිම තැනැත්තෙකු විසින් කලපු මෝය කට තුළ හෝ කලපු මෝය කටේ සිට මීටර් 183.0(යාර 200) ක සීමාව තුළ විසි දැල් හෝ විවුවලෙයි හැර වෙනත් කිසිම දැලක් භාවිත නොකළ යුතුය; හෝ

(ඇ) මසුන් ඇල්ලීම සඳහා යාන්ත්‍රික ධීවර යාත්‍රා කලපුව තුළ භාවිත නොකළ යුතුය.

7. කිසිම බලපත්‍ර දරන්නෙකු විසින් ප්‍රදේශය තුළ කොට්ටු හෝ කට්ටු දැල් ඉදි නොකළ යුතු අතර, දිස්ත්‍රික්කයේ දිසා ලේකම් හා ධීවර සහකාර අධ්‍යක්ෂවරයාගෙන් සමන්විත කමිටුවක් විසින්, එහි කැමැත්ත පරිදි, එම ප්‍රදේශය තුළ ඉස්සන් ඇල්ලීම සඳහා, කොට්ටු හෝ කට්ටු දැල්වල ප්‍රමාණය සහ ඒවා ඉදිකළ යුතු ප්‍රදේශ නිශ්චිතව දක්වමින්, ඒවා ඉදිකිරීම සඳහා අවසර දෙනු ලැබිය හැකිය.

8. ධීවර මෙහෙයුමක් සිදු කරන විට, මාළු දැලක් භාවිත කිරීම හා සම්බන්ධ යම් ධීවරයෙක් ඒ ස්ථානයේ රැඳී නොසිටින්නේ නම්, බලපත්‍ර දරන්නාගේ නම සහ බලපත්‍ර අංකය උසින් සෙන්ටිමීටර 5.2(අඟල් 2ක්) හා පළලින් සෙන්ටිමීටර 3.9 (අඟල් 1 1/2) නොඅඩු ප්‍රමාණයේ අකුරුවලින් මීටර් 50ක (යාර 55ක්) අන්තරයක් සිටින සේ (දැලට සම්බන්ධ කර ඇති) ඉපිලිවල පැහැදිලිව හඳුනාගත හැකි ආකාරයට සවිකොට ප්‍රදර්ශනය කළ යුතුය.

9. කොට්ටු හෝ ජාකොටු ධීවර මෙහෙයුම්කරුවන් තම නම් සහ බලපත්‍ර අංක උසින් සෙන්ටිමීටර 5.2(අඟල් 2ක්) හා පළලින් සෙන්ටිමීටර් 3.9කට (අඟල් 1 1/2කට) නොඅඩු ප්‍රමාණයේ අකුරුවලින් ලෑල්ලක පහසුවෙන් හඳුනාගත හැකි අයුරින් සවිකොට ප්‍රදර්ශනය කළ යුතුය.

10. මෙම නියෝග වල –

"අඩසිවලෙයි හෝ පාවෙන කරමල් දැල්" යන්නෙන්, ජලය මතුපිට ස්ථරයේ එලනු ලබන දැල් විශේෂයක් අදහස් වේ,

"කරයිවලෙයි හෝ මාදැල" යන්නෙන්, කෙලවරට පසුම්බියක් අමුණා ඇති තටුදැල් දෙකකින් සමන්විත වූ අවසාන වශයෙන් මසුන් හසු කර ගන්නා වූ මෝර කෙලවර හෙවත් මඩියකින් යුතු වූ මුහුදු වෙරළ දක්වා විහිදෙන්නා වූ කොහු කඹ දෙකක තටුදැල් දෙකේ අනෙක් කෙලවර ගැට ගසා ඇති කායිකව පැදවෙන යාත්‍රා මගින් මසුන් අර්ධ වශයෙන් වට කරමින් වෙරළට ආසන්න මුහුදේ එලනු ලැබ පසුව මිනිසුන් කණ්ඩායම් දෙකක් විසින් ක්‍රම ක්‍රමයෙන් වෙරළට අදිනු ලබන පාරම්පරික අදින දැල් විශේෂයක් අදහස් වේ,

"කොට්ටු හෝ කට්ටු දැල්" යන්නෙන්, රාමු සහිතව හෝ රහිතව දැල් වලින් සමන්විත සිලින්ඩරාකාරයේ හෝ කේතු ආකාරයේ උගුල් ද මසුන් දැලට යොමු කිරීම සඳහා වූ ආම්පන්නයකින් ද සමන්විත දැල් විශේෂයක් අදහස් වේ,

"බලපත්‍ර දරන්නා" යන්නෙන්, 1996 ධීවර මෙහෙයුම් නියෝග යටතේ නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක සන්තකය දරන තැනැත්තෙක් අදහස් වේ, සහ

"විවුවලෙයි හෝ විසිදැල්" යන්නෙන්, මීටර 4.572 සිට මීටර 6.096 දක්වා වූ (අඩි 15 සිට 20) දක්වා) අර්ධ විෂ්කම්භයකින් යුත් පුළුල් කටක් සහිත කේතු ආකාරයේ දැලක් අදහස් වන අතර, ඒ දැළ ක්‍රියාත්මක කරනු ලබන්නේ එක් පුද්ගලයෙක් විසින් දැළ නොගැඹුරු ජලයට විසි කිරීම මගිනි.

## උපලේඛනය

### මඩකලපුව කලපුව කළමනාකරණ ප්‍රදේශයේ නිර්වචනය

### 1 වන කොටස

මෙහි පහත නැවත දක්වා ඇති සැලසුමේ A, B, C රේඛාවට ඊශාන දිගින් පිහිටි මඩකලපුව කලපුවේ එම කොටස සහ ඊට අඩංගු වන :

(අ) කලපුවේ මෝයකට සිට කල්ලඩිපාලම දක්වා වූ ඇළ ප්‍රදේශය ;

(ආ) පුලියන්තිවු සහ බෆලෝ දූපත්වල නැගෙනහිර වෙරළ අවට ප්‍රදේශය ; සහ

(ඇ) පහත සඳහන් පරිදි වටවූ ඌරනිකුඩා.

උතුරට : මඩකලපුව කලපුව මුහුදට හමුවන ස්ථානයේ බටහිර වෙරළේ එක් ලක්ෂ්‍යයක සිට කලපුව මුහුදට හමුවන ස්ථානයේ කලපුවේ නැගෙනහිර වෙරළේ එක් ලක්ෂ්‍යයක් දක්වා සෘජු රේඛාවකින් මෝයකට හරහා නැගෙනහිර දෙසට ;

නැගෙනහිරට : අවසානයට සඳහන් ලක්ෂ්‍යයේ සිට කලපුවේ නැගෙනහිර වෙරළ ඔස්සේ ගිණිකොන සහ වයඹ වෙරළ හමුවන අනයිකාල් ගලේ සිට නැගෙනහිර අතට දිවෙන "A" රේඛාවේ ලක්ෂ්‍යයක් දක්වා එහි සිට බළලෝ දූපතේ නැගෙනහිර වෙරළේ ඉඩයිපිඩ්ඩි සිට "B" ලක්ෂ්‍යයේ දකුණු දෙසට ;

දකුණට : අවසානයට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට බළලෝ දූපත සහ කලපුව හරහා වෙල්ලයිකල් ගල කලපු ඉවුර හමුවන තැන සිට උතුරු දෙසට රේඛාවක් දිවෙන ස්ථානයේ තිම්ලතිවු හි "C" සලකුණු කර ඇති ලක්ෂ්‍යය දක්වා ;

බටහිරට : අවසානයට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට ඊසාන දිග සහ වයඹ සහ උතුරු දෙසට ගිණිකොන සහ දකුණු දිශාවට සහ එතැන් සිට නැවතත් කලපුවේ බස්නාහිර වෙරළ ඔස්සේ උතුරුදිග මායිමේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා.

2 වන කොටස

ප්‍රදේශය 3 හැර, මෙහි පහත නැවත දක්වා ඇති කටු සටහනේ A, B, C රේඛාවට වයඹින් සහ දකුණින් පිහිටි මඩකලපුව කලපුවේ එම කොටස සහ ඊට අඩංගු වන –

(අ) සිරුවාමුනෙයි කඩල්,

(ආ) මන්මුනෙයි ප්‍රදේශය, සහ

(ඇ) පහත සඳහන් පරිදි වටවූ කල්ලාර් ප්‍රදේශය.

උතුරට : කලපුවට ඇතුළුවන කඩිනාඔඩ්ඩෙයිආරු යන ලක්ෂ්‍යයේ සිට දකුණු දිශාවට සහ ගිණිකොන දෙසට කලපුවේ වෙරළ ඔස්සේ තිම්ලතිවුහි "C" සලකුණු කර ඇති වෙල්ලයික්කාල් දක්වා සහ එතැන් සිට "B" සලකුණු කර ඇති බළලෝ දූපතේ ඉඩයිප්පිඩි දක්වා ප්‍රදේශ 1හි දකුණු දිග මායිම දක්වා සහ එතැන් සිට උතුරු දෙසට ප්‍රදේශය 1හි දක්වා ඇති "A" සලකුණ දැක්වූ ලක්ෂ්‍යය ;

නැගෙනහිරට : අවසානයට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට දකුණු දිග සහ ගිණිකොන ඔස්සේ ඔන්ඩච්චිමඩම්හි මඩකලපුව – කල්මුණේ ප්‍රධාන මාර්ගයේ බස්නාහිර දිසාව හමුවන තෙක් කලපුවේ නැගෙනහිර වෙරළ ඔස්සේ සහ එතැන් සිට මඩකලපුව – කල්මුණේ ප්‍රධාන මාර්ගයේ බස්නාහිර මායිම සහ එතැන් සිට එම මාර්ගයේ බස්නාහිර මායිම ඔස්සේ දකුණු දිශාවට සහ කලපුවට ඇතුල් වන පදිප්පොලෙයිආරු ලක්ෂ්‍යය හමුවන කලපුවේ නැගෙනහිර වෙරළ ඔස්සේ දකුණු දිශාවට ;

දකුණට සහ බස්නාහිරට : කලපුවේ බස්නාහිර මායිම ඔස්සේ අවසානයට සඳහන් කළ ලක්ෂ්‍යයේ බටහිර දෙසට, උතුරු දෙසට උතුරු මායිමේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා.

3 වන කොටස

ඔන්ඩච්චිමඩම් සහ කල්ලාර් දියමංකඩ වලට නැගෙනහිරින් ප්‍රධාන දකුණු වෙරළ පාර සහ පහත සඳහන් පරිදි මායිම් වූ ප්‍රදේශයන් අතර පිහිටි කලපුවට අඩංගු කොටස :–

උතුරට සහ නැගෙනහිරට : ඔන්ඩච්චිමඩම් හි මඩකලපුව – කල්මුණේ පාරේ බටහිර මායිමට යා වන කලපුවේ නැගෙනහිර වෙරළ පිහිටි ලක්ෂ්‍යයේ සිට කල්ලාර් සුසානභූමියට යාබද රජයේ ඉඩම දක්වා වූ නැගෙනහිර දිසාවට සහ දකුණු දිසාවට දිවෙන කලපුවේ නැගෙනහිර වෙරළ ඔස්සේ වූ කොටස ;

දකුණට සහ බටහිරට : අවසානයට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට කලපුවේ බටහිර වෙරළ ඔස්සේ බටහිර දිශාවට සහ උතුරු දිශාවට දිවෙන මඩකලපුව – කල්මුණේ ප්‍රධාන මාර්ගයේ බටහිර මායිම හමුවන ස්ථානය දක්වා වූ ලක්ෂ්‍යය, එතැන් සිට උතුරු මායිමේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා උතුරු දිශාවට.

# මඩකලපුව කලපුවේ සිතියම

